# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1770/2 - 2012 අගෝස්තු මස 06 වැනි සඳුදා - 2012.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ව්‍යවස්ථාපිත නිශ්චය අංකය - 4621
විශේෂ අංකය - මහ/105

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය**

ගලගෙදර, මිනිගමුව, වල්පොල, හියදළ යන ලිපිනයෙහි පදිංචිව සිටි හේරත් මුදියන්සේලෑ මීගහ ඇලේ අප්පුහාමි හේරත් මහතා විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලද අතර මේ වන විට ඔහු මියගොස් ඇති බැවින් පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව, මෙම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට අයිතිව තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඔහුට තබා ගැනීමට ඉඩදිය යුතු කොටස නිශ්චය කරමින් ඔහුගේ බූදලයට ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැනුම්කරුට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි පහත උපලේඛනයෙහි දැක්වේ.

අධි නීතිඥ නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2012 ජූලි මස 31 වැනි දින,
අංක සී 82,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ උඩපළාත බටහිර කෝරලේ සුළු කොට්ඨාසයේ මිනිගොමුව ගමෙහි පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අතිරේක අංක 02 අවසාන ගම් පිඹුරු අංක 158 හි රිටගහතැන්න, අස්වැද්දුමේ හේන, අංගේ කුඹුර, තැන්න වෙල කුඹුර, තැන්න වෙල වත්ත නැමැති ඉඩමේ අක්කර 02, රූඩ්. 1, පර්චස් 21 ක ප්‍රමාණය ඇති කැබලි අංක 644, 645, 646, 647, 648 දරන බිම් කැබලි සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලිද,

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ ගනත පළාත සුළු කොට්ඨාසයේ සිවුරුපිටිය යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අතිරේක අංක 01 අවසාන ගම් පිඹුරු අංක 167 හි මේරියන් හිල් වත්ත නැමැති ඉඩමේ නොබෙදූ අක්කර 36, රූඩ්. 3, පර්චස් 10 ක ප්‍රමාණය ඇති කැබලි අංක 157, 158, 159 දරන බිම් කැබලි සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලිද,

3. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ ගනත පළාත සුළු කොට්ඨාසයේ එරමුදුලියද්ද යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අතිරේක අංක 02 අවසාන ගම් පිඹුරු අංක 168 හි මේරියන් හිල් වත්ත නැමැති ඉඩමේ නොබෙදූ අක්කර 10, රූඩ්. 0, පර්චස් 17 ක ප්‍රමාණය ඇති කැබලි අංක 396 හා 397 දරන බිම් කැබලි සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලිද වේ.

08 - 578

1A - G 016398 — 340 (2012/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.